විජය ප්‍රකාශනයකි
අද
city edition
2023-12-11
සඳුදා
012 / 243
RS.40/=



# නාය යෑමේ අනතුරු ඇඟවීම් දිස්ත්‍රික්ක 9කට

බොහෝ ප්‍රදේශවලට අදත් වැස්ස

>>P2



# කැලිපානාවෙල ගමෙන් බාගයක් නාය යයි

කලින් ඉවත් වූ නිසා පුද්ගලයන් 97කගේ ජීවිත බේරෙයි

>>P2

## පස් කඳු කඩාවැටීමෙන් බදුල්ල -කොටුව අතර දුම්රිය ධාවනයට බාධා

කොළඹ - බදුල්ල බර වාහන හා බස් ධාවනයට විකල්ප මාර්ගයක්

>>P6

# භාණ්ඩ හා සේවා 97කට වැට් එයි

භාණ්ඩ හා සේවා කුමක්දැයි නිශ්චිතව හෙළි දරව් වුණේ නෑ

වැට් පනත් කෙටුම්පත් විවාදය පැවැත්වීමට ඝන පූර්ණයට අවශ්‍ය මන්ත්‍රීවරු 20 දෙනාවත් සභාගැබේ නෑ, පාර්ලිමේන්තුවත් කල් දමයි

ඉරිදා දිනයේ දීත් පාර්ලිමේන්තුව පවත්වමින් ආණ්ඩුව වැට් පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ හදිසි අවශ්‍යතාවක් බව කියමින්, ඒත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත් සභා ගැබේ නෑ

පාර්ලිමේන්තුව රැස්වීමට දිනකට වැයවන රු.ලක්ෂ 80-100ක මහජන මුදලත් අපතේ යයි



# දිවයින පුරා විදුලිය විසන්ධි වුණේ අකුණක් නිසා?

පැය 5ක කාලයක් විදුලිය විසන්ධි වීම ගැන ස්වාධීන පරීක්ෂණයක් ඕනෑ

- ලංවිම තාක්ෂණික ඉංජිනේරු හා අධිකාරි සංගමය

>>P2



## ජනතාවට අසීමිත බදු බර පැටවීමේ උත්සාහය කල් දමා ගැනීමට කටයුතු කළා

- විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස

>>P2

## විදුලිය විසන්ධි වීම ගැන පරීක්ෂණ 2ක්

>>P6



## නොරොච්චෝලේ අක්‍රිය වෙයි

ජල විදුලියට පිංසිදුවීමට අඛණ්ඩව විදුලිය

>>P2

## වැට් බදු පනත සම්මත කිරීම විපක්ෂය කඩාකප්පල් කළා



අද නැවත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නවා

- ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ප්‍රසන්න රණතුංග

>>P2

## තැපෑලේ 27,000ක් හෙට රාත්‍රී වනතුරු සේවයෙන් ඉවතට

ඉන්දික හේවාවිතාරණ

ඉල්ලීම් හතරක් මුල්කර ගනිමින් ඊයේ (10දා) සවස 4.00 සිට හෙට (12දා) මධ්‍යම රාත්‍රී 12.00 දක්වා පැය 56ක කාලයක් තැපැල් වෘත්තීය සමිති 27කට අයත් පිරිස් සේවයෙන් ඉවත්ව සිටීමට කටයුතු කර තිබෙන බව ඒකාබද්ධ තැපැල් වෘත්තීය සමිති පෙරමුණ සඳහන් කරයි.

මේ අනුව තැපැල් කාර්යාල 653ක, උපතැපැල් කාර්යාල 3,410ක හා පාලන කාර්යාල හා මධ්‍යම තැපැල් හුවමාරුවේ සේවය කරන 27,000කට අධික සේවකයන් රාජකාරි කටයුතුවලින් ඉවත් වන බව එම සංගමයේ සමකැඳවුම්කරු චින්තක බණ්ඩාර මහතා සඳහන් කළේය.

නුවරඑළිය තැපැල් කාර්යාල ඇතුළු තැපැල් දෙපාර්තමේන්තුවේ දේපළ විකුණා දැමීමට සිදුකරන සැලසුම් අවලංගු කරන ලෙසත්, තැපැල් සේවකයන්ට ඇති වී තිබෙන පරිපාලන ගැටලු විසඳීමට අවශ්‍ය මුදල් ලබාදෙන ලෙසත්, තැපැල් සේවකයන් ඇතුළුව පොදුවේ සියලුම රාජ්‍ය සේවකයන්ට රුපියල් විසිදහසක මාසික දීමනාවක් ලබා දෙන ලෙසත් හා ඉල්ලා හා තැපැල් සේවකයන් විසින් රාජ්‍ය බැංකුවලින් ලබාගත් ණයවලට අදාළ පොලී මුදල් අඩු කරන ලෙස ඉල්ලමින් මෙම ක්‍රියාමාර්ගය සිදුකරන බවද පවසා සිටියේය.

මීට පෙරත් මෙම ඉල්ලීම් මුල්කර ගනිමින් විවිධ වෘත්තීය ක්‍රියාමාර්ග සිදු කළ බවත් එහෙත් අදාළ ගැටලු විසඳීම සඳහා බලධාරීන් කටයුතු නොකිරීම නිසා මෙම වැඩවර්ජනය සිදුකිරීමට තීරණය කළ බවත් මෙයට නිසි විසඳුම් නොලැබුණහොත් ඉදිරියේදී වෘත්තීය ක්‍රියාමාර්ග දැඩි කරන බවත් සඳහන් කළේය.

## මිහින්තලේ සිටි ආරක්ෂක අංශවල 252ක් ඉවතට



'ගහන්න ගහන්න වඳින මිනිහයි, වඳින්න වඳින්න ගහන මිනිහයි මෝඩයෝ, සෙබළු ඉවත්කිරීමේ තීරණයේ වෙනසක් නෑ'

- ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්

මෙම ක්‍රියාමාර්ගයට අප්‍රසාදය පළ කරනවා, මෙවැනි අමනෝඥ තීරණ ගන්න එපා

- විපක්ෂනායක සජිත් ප්‍රේමදාස

>>P6

රාගම උකස් මධ්‍යස්ථානයකින් රු.කෝටි 14ක රන් හා මුදල් කොල්ල කෑ

## සැකකරුවන් 05ක් අත්අඩංගුවට

සැකකරුවන් අතර එම මධ්‍යස්ථානයේ අයකැමිවරියක හා භාරකරුත්

>>P3

## මහපොළට ලැබෙන මුදල 19%කින් කපලා

- මහාචාර්ය වසන්ත අතුකෝරාළ

>>P6




## 2023 කිරි නිෂ්පාදන ආනයනයට ඇ.ඩො.මි. 221ක් වැය වෙලා

චන්දන සමරවික්‍රම

මෙම වර්ෂයේ 2023 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා වූ කාලසීමාව තුළදී කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 221.4ක මුදලක් වැය වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති වාර්තාවක සඳහන් වේ.

ඉකුත් 2022 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලසීමාවේදී කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 184.1ක මුදලක් වැය කර තිබුණි. මෙම වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී පමණක් කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා ඩොලර් මිලියන 15ක මුදලක් වැය කර ඇති බව මහ බැංකු වාර්තාවේ සඳහන් වේ. මෙරට කිරි අවශ්‍යතාවයෙන් 48%ක් දේශීය නිෂ්පාදනයෙන් සපුරා ගනු ලබන අතර, මෑතකාලීන දත්තවලට අනුව ශ්‍රී ලංකාව බිලියන 63.1ක පමණ මුදලක් වැය කරමින් කිරි ආශ්‍රිත නිෂ්පාදන මෙට්‍රික්ටොන් 88,482ක් ආනයනය කරනු ලබන බවද මුදල් අමාත්‍යාංශය විසින් පෙන්වා දෙයි.

## නාගරික සංවර්ධනය මෙතෙක් නොගෙවූ රු.මි.1989ක් ගෙවයි

>>P3

## ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ විශේෂ රැස්වීමක් අද

>>P3

## කාලගුණය

උපරිම උෂ්ණත්වය
**33°C** යාපනය

අවම උෂ්ණත්වය
**14°C** නුවරඑළිය

වැසි තත්ත්වය
උතුරු, උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල වැසි වාර කිහිපයක් ඇති වේ. දිවයිනේ සෙසු ප්‍රදේශවල ප.ව. 1.00 න් පමණ පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

සුළං තත්ත්වය
ගිගුරුම් සහිත වැසි සමග තාවකාලික තද සුළං ඇති විය හැකිය. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට පියවර ගන්න.

මුහුදේ තත්ත්වය
පොතුවිල් සිට මඩකලපුව සහ ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල විශේෂයෙන් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

අද කර්තෘ මණ්ඩලය
ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.
දුරකථන:
2479670, 2479671
ෆැක්ස්:
2479668
විද්‍යුත් තැපැල:
ada@wijeya.lk / adanewspaper@gmail.com
වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830
බෙදාහැරීමේ අංශය:
011 2479 625
දායකත්ව අංශය:
011-2479 626

අද
පාඨක අයිතීන් සුරැකීම
අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.
මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.
ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.
ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka
96, කිරුළ පාර, කොළඹ 05.
දුරකතනය 5 353 635
ෆැක්ස් 5 335 500
ඉමේල් pccsl@pccsl.lk
වෙබ් www.pccsl.lk

# නාය යෑමේ අනතුරු ඇඟවීම් දිස්ත්‍රික්ක 9කට




● ඉන්දික හේවාවිතාරණ

දිස්ත්‍රික් නවයකට ඇති වී තිබෙන වැසි තත්ත්වය නිසා එම දිස්ත්‍රික්කවල පිහිටි කඳු ආශ්‍රිත ප්‍රදේශ නායයෑම්වලට ලක්විය හැකි බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහන් කරයි.

මේ අනුව බදුල්ල, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, නුවරඑළිය හා රත්නපුර යන දිස්ත්‍රික්කවල කඳු ආශ්‍රිත ප්‍රදේශවල ජීවත්වන ජනතාවට මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙසටත් ඉල්ලා සිටියි.

නාය යෑම් ලක්ෂණ දුටු වහාම ආරක්ෂිත ස්ථානවලට ගමන් කරන ලෙසට එම සංවිධානය ඉල්ලා සිටින අතර අද (11දා) උතුරු, උතුරු මැද සහ නැගෙනහිර පළාත්වල වැසි වාර කිහිපයක් ඇති විය හැකි බව කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

දිවයිනේ සෙසු ප්‍රදේශවල සවස 1.00න් පමණ පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බවත් බස්නාහිර, සබරගමුව, මධ්‍යම,දකුණු සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැකි බවද පෙන්වා දෙයි.

ගිගුරුම් සහිත වැසි සමග ඇති විය හැකි තාවකාලික තද සුළංවලින් සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව ජනතාවගෙන් ඉල්ලා සිටියි.

# කැලිපානාවෙල ගමෙන් බාගයක් නාය යයි

## කලින් ඉවත් වූ නිසා පුද්ගලයන් 97කගේ ජීවිත බේරෙයි

● හල්දුම්මුල්ල - එස් .පී. නානායක්කාර/ඇල්ල - ප්‍රසාද් රුක්මල්/බදුල්ල - පාලිත ආරියවංශ

පැවති අධික වර්ෂාව සමග හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කැලිපානාවෙල අස්වැද්දුම කන්දේ විශාල ප්‍රදේශයක් පෙරේදා (09දා) සවස නායගිය බවත් එහි පදිංචිව සිටි අය ඉන් ඉවත් කරගෙන තිබූ බැවින් පවුල් විසිපහක පුද්ගලයන් අනූහත්දෙනකුගේ ජීවිත බේරා ගැනීමට හැකිවූ බවත් හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් ඒ. කේ. ජේ. ප්‍රියංගිකා මහත්මිය පැවසුවාය.

නාය යෑමේ මූලික ලක්ෂණ පහළ වීමත් සමගපසුගිය 08වනදා දින රාත්‍රියේ පදිංචි ස්ථානවලින් පවුල් විසිපහක් විගසින් ඉවත් කරගත් බවත් උදෑසන එම නිවාසවල තිබූ බඩුමුට්ටුද ඉවත් කරගෙන තිබුණු බවත් ප්‍රාදේශීය ලේකම් ප්‍රියංගිකා මහත්මිය පැවසීය.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය එම ස්ථානයේ කළ භූමි පරීක්ෂාවකින් පසුව අධිඅවදානම් කලාපයක් ලෙස මෙම ප්‍රදේශය නම් කරන ලදී.

නාය යෑමේ වපසරිය අක්කර දෙසියයක් පුරා විහිද ගොස් ඇති බවත් එහි පදිංචිව සිටි පවුල් තිස්එකක පුද්ගලයන් එකසිය හතළිස් එකක් මේ වන විට ඉන් ඉවත් කිරීමට පියවර ගෙන ඇති බවත්, නාය යෑමෙන් ඊයේ (10දා) දහවල් වනවිට ගෙවල් 08ක් විනාශවී තිබෙන බවද හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් ඒ.කේ. ජේ. ප්‍රියංකා මහත්මිය ඊයේ (10දා) පැවසීය.

මේ වන විට ඉවත් කළ පවුල් තාවකාලිකව ඥාති නිවෙස්වල රඳවා ඔවුන් සඳහා පිසූ ආහාර ලබාදීමට කටයුතු කර ඇති බවත් මේ පිරිස ස්ථිර සුරක්ෂිත මධ්‍යස්ථානයක රැඳවීමට සැලසුම්කර ඇති බවත් ප්‍රාදේශීය ලේකම් ප්‍රියංගිකා මහත්මිය පැවසීය. කැලිපානාවෙල මෙම නාය යෑම සම්බන්ධව භූමි පරීක්ෂාවක් කරමින් අධිඅවදානම් ලෙස නම්කරන ලද භූවිද්‍යාඥ නිපුන් වීරසේකර, ග්‍රාම නිලධාරී සනත් කුමාරසිංහ, ආපදා සහන නිලධාරී වසන්ත කුමාර යන මහත්වරු එම ස්ථානයෙන් ඉවත්ව ගොස් සුළු මොහොතකින් මෙම කන්ද ගැලවී ගොස් ගම්මානයම යට වී තිබේ.

කැලිපානාවෙල පාසලද මෙම නාය යෑමට ගොදුරු වී ඇති බැවින් එම පාසල යළි දැනුම් දෙන තුරු අද (11දා) සිට වසා ඇති බව බණ්ඩාරවෙල කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ධම්මික හේරත් මහතා පැවසීය.

මෙම නාය යෑම හේතුවෙන් කැලිපානාවෙල අලකොළමඩ පාරද සම්පූර්ණයෙන් වැසී ගොස් තිබෙන අතර, මෙම නාය යෑමට කුඹුරු යායක්ද යටවී ඇති බවත් බදුල්ල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පැවසීය.

මේ වන විට නිවාස අටක් නොපෙනී ගොස් ඇති බවත් අනෙක් නිවාස ගොදුරු කරගනිමින් තවදුරටත් සුන්බුන් සමග නාය යෑම පහළට ගලමින් තිබෙන බවත් ප්‍රදේශවාසීහු පවසති.

# දිවයින පුරා විදුලිය විසන්ධි වුණේ අකුණක් නිසා?

## පැය 5ක කාලයක් විදුලිය විසන්ධි වීම ගැන ස්වාධීන පරීක්ෂණයක් ඕනෑ

### - ලංවිම තාක්ෂණික ඉංජිනේරු හා අධිකාරි සංගමය

● ඉන්දික හේවාවිතාරණ

දිවයින පුරා පෙරේදා (09දා) පස්වරුවේ පැය 5කට ආසන්න කාලයක් විදුලිය විසන්ධි වීම පිළිබඳව ස්වාධීන අපක්ෂපාතී පරීක්ෂණයක් සිදුකළ යුතු බව ලංකා විදුලි බලමණ්ඩලයේ තාක්ෂණික ඉංජිනේරු හා අධිකාරි සංගමය සඳහන් කරයි.

2015 වසරේ සිට මේ වන විට අවස්ථා පහකදී දිවයිනටම බලපාන ලෙස එකවර විදුලි විසන්ධි වීම් පහක් සිදුවී තිබෙන බවත් පෙරේදා දිනයේ සිදු වූ සිදුවීමට පෙර සිදු වූ සිදුවීම් හතරක් පිළිබඳව සොයා බැලීමට කමිටු පත් කළ බවද එම සංගමයේ සභාපති ඒ.ජී.යූ නිශාන්ත මහතා සඳහන් කළේය.

අදාළ කමිටු විසින් වාර්තා පවා ලබා දී තිබෙන බවත් එම වාර්තාවල නිර්දේශ නිසි ලෙස ක්‍රියාත්මක වූවාදැයි කිව නොහැකි බවත් පෙරේදා දිනයේදී සිදු වූ විදුලි විසන්ධි වීම යථා තත්ත්වයට පත් කිරීමට පැය පහකට අධික කාලයක් ගත වී තිබෙන බවත් එතරම් කාලයක් ගත වීම පිළිබඳවත් තම සංගමය සෑහීමකට පත් නොවන බවද පවසා සිටියේය.


කොත්මලේ සිට බියගම දක්වා දිවෙන අධිබලැති සම්ප්‍රේෂණ රැහැන් පද්ධතියට අකුණක් පතිත වීමෙන් විදුලිය සැපයුම් පද්ධතිය අක්‍රිය වී ඇති බවට ප්‍රකාශ වෙමින් තිබෙන බවත් එම පද්ධතියට අකුණක් පතිත වී තිබුණහොත් පද්ධතිය අක්‍රිය විය හැකි බවත් එහෙත් එම තත්ත්වය තුළ දිවයිනේම විදුලිය විසන්ධි වීම ගැන සෑහීමකට පත්විය නොහැකි බවද සඳහන් කළේය.

සාමාන්‍යයෙන් අකුණු ඇතිවීම සිදුවන බවත් මේ නිසා විදුලි පද්ධතියේ ආරක්ෂාව පිළිබඳව මීට වඩා සැලකිලිමත් විය යුතු බවත් බත්තරමුල්ල පැලවත්ත ප්‍රදේශයේ මෙවැනි තත්ත්වයන්ට මුහුණ දීම සඳහා පාලන පද්ධතියක් තිබෙන බවත් මෙය ඉදිකරන විට තිබූ අපේක්ෂාවන් කොතරම් දුරට සිදුවනවාද යන්න ප්‍රශ්නයක්ව තිබෙන බවද කියා සිටියේය.

දත්ත පදනම්ව විදුලි විසන්ධි වීම යථා තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කරනු ලැබුවේ නම් මීට වඩා අඩු කාලයකදී විදුලිය යථා තත්ත්වයට පත්කර ගැනීමට හැකියාව තිබූ බවද පවසා සිටියේය.

2021 වසරේ දෙසැම්බර් 3වන දින දිවයිනටම බලපාන ලෙස විදුලිය විසන්ධි වී තිබෙන බවත් මීට අමතරව 2015 සැප්තැම්බර් 27 හා 2016 වසරේදී අවස්ථා දෙකකදී හා 2020 වසරේදි එක් අවස්ථාවකදීත් විදුලිය විසන්ධි වීම් සිදුවී තිබෙන බවද සඳහන් කළේය.

නොරොච්චෝල බලාගාරයේ එක් යන්ත්‍රයක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබෙන බවත් විදුලි විසන්ධි වීම සම්බන්ධයෙන් කමිටු පත් කළ පසු කමිටුවලට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු බවද පවසා සිටියේය.




# භාණ්ඩ හා සේවා 97කට වැට් එයි

● දිනේෂ් සමරකෝන්

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත මගින් භාණ්ඩ හා සේවා 97කට ලබා දී තිබූ වැට් සහනය ඉවත් කර නැවත වැට් පැනවීමක් කරන බව ඊයේ (10දා) පාර්ලිමේන්තුවේදී අනාවරණය විය. එහෙත් එම භාණ්ඩ හා සේවා කවරේද යන්න පිළිබඳව නිශ්චිතව හෙළිදරව් නොවුණි.

කෙසේ වෙතත්, මෙම පනත් කෙටුම්පත විවාදය පැවැත්වීමට සභාගර්භයේ ඝනපූර්ණය නොමැතිවීමෙන් ඊයේ (10දා) ප.ව 12.05ට පමණ පාර්ලිමේන්තුව අද (11දා) පෙ.ව 9.30 දක්වා කල්තැබිණි.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමේ විවාදය ඊයේ පෙ.ව 9.30ට පමණ ආරම්භ වූ අතර, එය ප.ව 4.30 දක්වා පැවැත්වීමට නියමිතව තිබිණි.

එහෙත් විපක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර මහතා විසින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ඝනපූර්ණය පිළිබඳව මූලාසනයේ අවධානයට යොමු කරන ලදී. ඒ අනුව බෙදුම් සීනුව විනාඩි 05ට වැඩි කාලයක් නාද කිරීමෙන් අනතුරුවද ඝනපූර්ණය නොවූ හෙයින් ස්ථාවර නියෝග අනුව පාර්ලිමේන්තුව අද පෙ.ව. 9.30 දක්වා කල්තබන බව මූලාසනය හෙබවූ නියෝජ්‍ය කථානායක අජිත් රාජපක්ෂ මහතා නිවේදනය කළේය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 73 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ඝනපූර්ණය මූලාසනාරූඪ මන්ත්‍රීවරයාද ඇතුළුව මන්ත්‍රීවරයන් විසිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. කෙසේ වෙතත් මෙම අවස්ථාවේ පාර්ලිමේන්තු සභා ගර්භයේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් 16ක් සහ විපක්ෂය නියෝජනය කරමින් නලින් බණ්ඩාර මහතා පමණක් සිටි අතර, ඒ අනුව නියෝජ්‍ය කථානායකවරයා විසින් ඝනපූර්ණය නොමැති බව සඳහන් කරමින් පාර්ලිමේන්තුව කල් තැබීමට කටයුතු කළේය.

විශේෂ දිනයක් ලෙස ඊයේ ඉරිදා දිනය යොදා ගනිමින් මෙම එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීම විවාදයට ගැනීම සඳහා ආණ්ඩු පක්ෂය විසින් ඉදිරිපත් කළද, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට සභා ගර්භයේ ඝනපූර්ණය තබා ගැනීමට නොහැකි විය.

මෙම අවස්ථාවේ විපක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් 10කට ආසන්න සංඛ්‍යාවක් සිටියද ඝනපූර්ණය සීනුව නාද කරන අවස්ථාවේ ඔවුහු සභා ගර්භයේ නොසිටියහ. මෙහිදී එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත මගින් භාණ්ඩ 97කට ලබා දී තිබූ වැට් සහනය ඉවත් කර නැවත වැට් පැනවීමක් සිදුවන බව මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මහතා පැවසීය.

කෙසේ වෙතත් පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් චෝදනා කරනු ලැබුවේ මෙම භාණ්ඩ නිසි පරිදි නම් කර නොමැති බවයි.

ඒ අනුව වැට් බදු අය වන ලබන්නේ කුමන භාණ්ඩවලින්ද යන්න පිළිබඳව සොයාගත නොහැකි බවද විපක්ෂයේ මන්ත්‍රීවරුන් චෝදනා කළහ.

කෙසේ වෙතත් මෙම අවස්ථාවේ පනත් කෙටුම්පත මගින් ඉදිරිපත් කර තිබූ ඇතැම් භාණ්ඩ වැට් බදු පැනවීමක් සිදු නොකරන බවට විපක්ෂය පෙන්වාදීමෙන් නිසි පරිදි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර නොමැති බවට අනාවරණය විය.

පාර්ලිමේන්තුව රැස්වන දිනකදී රුපියල් ලක්ෂ 80-100ත් අතර මුදලක් වැය වන අතර, එලෙස ඊට ආසන්න මුදලක් වැය කරමින් විශේෂ දවසක් යොදා ගනිමින් පාර්ලිමේන්තුව පැවැත්වුවද එහිදී මුදල් පමණක් වැය වී නියමිත රාජකාරිය ඉටු කර ගැනීමට නොහැකි විය.

# ජනතාවට අසීමිත බදු බර පැටවීමේ උත්සාහය කල් දමා ගැනීමට කටයුතු කළා

## - විපක්ෂනායක සජිත් ප්‍රේමදාස

● දිනේෂ් සමරකෝන්

වර්තමාන රජය රටේ ජනතාවගේ කරපිට අසීමිත බදු බරක් පටවන්න ගත් උත්සාහය විපක්ෂයේ සියලු කණ්ඩායම් එකතු වී කල් දමා ගැනීමට කටයුතු කළ බවත්, ඒ අනුව භාණ්ඩ 97ට වැට් බදු පැනවීම වහාම නතර කර ගැනීමට ආණ්ඩුවට ප්‍රඥාව පහළ වේවා කියා සිතන බවත් විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

පාර්ලිමේන්තු සංකීර්ණයේදී ඊයේ (10දා) පැවති මාධ්‍ය හමුවකට එක්වෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා මෙලෙස සිය අදහස් දක්වා සිටියේය.

"අද දවසේදී අපිට පුළුවන්කම ලැබුණා සමගි ජන බලවේගය වගේම විපක්ෂයට සම්බන්ධ සියලුම විපක්ෂ කණ්ඩායම් සෑමදෙනාම එකතු කරගෙන සාමූහික ක්‍රියාදාමයක් තුළ වර්තමාන රජය රටේ ජනතාවගේ කරපිට අසීමිත බදු බරක් පටවන්න ගත් උත්සාහය යම්කිසි ක්‍රමවේද තුළ රජයට කල්දැමීමට කටයුතු කරන්න. අපිට ඒක ජනතාව වෙනුවෙන් දිනාගන්න අවස්ථාව ලැබුණා. වර්තමාන රජය අසාර්ථක, අකාර්යක්ෂම, දුර්වල රජයක් සහ මූල්‍ය පරිපාලනය ක්‍රියාත්මක කර ගන්න බැරි රජයක්.

රජයට බැරිවෙලා තියෙනවා හරියාකාරව වැට් ගහන ලැයිස්තුව ඉදිරිපත් කරන්න. ඒ වගේම රජයට බැරිවෙලා තියෙනවා මේ වගේ ක්‍රියාදාමයකදී තමන්ගේ රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරනවා කියන බහුතරය ගෙන්වා ගන්න. අද ඝනපූර්ණය අසම්පූර්ණයි කියන ඒ උපක්‍රමය අපි අද යෙදෙව්වේ අඩුම ගානේ ආණ්ඩුවට පොඩ්ඩක් හරි ප්‍රඥාව පහළ වෙලා මේ වැට් නොගහන ලැයිස්තුවේ තිබුණු 120න් 97ක් ඉවත් කිරීම වහාම නතර කර ගැනීමටයි."

# වැට් බදු පනත සම්මත කිරීම විපක්ෂය කඩාකප්පල් කළා

අද නැවත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නවා

## - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ප්‍රසන්න රණතුංග

● දිනේෂ් සමරකෝන්

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබූ වැට් බදු පනත සම්මත කිරීම විපක්ෂය හිතාමතා කඩාකප්පල් කළද එය යළි අද (11දා) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමට කටයුතු කරන බව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවසීය.

ආණ්ඩුවට ඇතැම් අවස්ථාවලදී ජනතාවගේ පැත්තෙන් සිතා ජනප්‍රිය නොවන තීන්දු ගැනීමටද සිදුවන බවත්, ආණ්ඩුවකට සෑම අවස්ථාවකම ජනප්‍රිය තීන්දු පමණක් ගත නොහැකි බවත් පෙන්වා දෙන ඇමතිවරයා වැට් බදු පනත සම්මත කර ගැනීම ජනප්‍රිය තීන්දුවක් නොවන බව දන්නා නමුත් එය සම්මත කර ගැනීමට කටයුතු කරන්නේ මෙරට ජනතාවගේ පැත්තෙන් සිතා බවද අවධාරණය කළේය. සභාව කල් තැබීමෙන් අනතුරුව සභානායක සුසිල් ප්‍රේමජයන්ත් මහතා සහ තමන් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත් ඒ අනුව වැට් බදු පනත යළි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් සඳහන් කළ ප්‍රසන්න රණතුංග මහතා,

"ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ වත්මන් ආණ්ඩුව රට තුළ යම් ආර්ථික ස්ථාවරයක් ඇති කිරීම සඳහා කටයුතු කරමින් සිටින බව පැහැදිලියි. රට මුහුණපා සිටින ආර්ථික බංකොලොත්භාවයෙන් රට මුදාගැනීමට නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු බව ඕනෑම අයෙක් පිළිගන්නා කරුණක් වනවා. එය මෙරට ආර්ථිකය ගොඩගැනීම සඳහා පිටිවහලක් වනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟතාවෙන් කටයුතු කිරීමෙන් දැනට අඩාළ වී ඇති මෙරට සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීමට හැකි වනවා. සංචාරක ව්‍යාපාරය යළි යථා තත්ත්වයට පත් වනු ඇති අතර මෙරට ආයෝජනය සඳහා විදෙස් ආයෝජකයන් යළි මෙරටට පැමිණීමටද මෙම එකඟතා ඉවහල් වන බව මම විශ්වාස කරනවා."

යනුවෙන්ද සඳහන් කළේය.

# නොරොච්චෝලේ අක්‍රිය වෙයි

● ඉන්දික හේවාවිතාරණ/පුත්තලම හිරාන් ප්‍රියංකර ජයසිංහ

නොරොච්චෝල ලක්විජය බලාගාරයේ ක්‍රියාත්මක වෙමින් පැවති පළමු ජනන යන්ත්‍රය පෙරේදා (09දා) රාත්‍රියේ දිවයින පුරා සිදු වූ හදිසි විදුලි බිඳවැටීමත් සමග නැවතී යාමෙන් එම බලාගාරයෙන් මේ වනවිට ජාතික පද්ධතියට විදුලිය ලබාදීම සම්පූර්ණයෙන් නැවතී ඇති බව විදුලිබල මණ්ඩල මාධ්‍ය ප්‍රකාශක ඉංජිනේරු නොයෙල් ප්‍රියන්ත මහතා ඊයේ (10දා) පැවසීය. නොරොච්චෝල බලාගාරයෙන් විදුලිය නිෂ්පාදනය නැවතී ගියද මේ වනවිට ජල විදුලි බලාගාර ආශ්‍රිතව පවතින ජල මට්ටම අනුව විදුලි පාරිභෝගිකයන් අපහසුතාවට පත් නොකර විදුලිය ලබාදීමට හැකිව ඇති බව ඉංජිනේරු නොයෙල් ප්‍රියන්ත මහතා පවසයි. නොරොච්චෝල ලක්විජය බලාගාරයේ දෙවැනි හා තුන්වැනි ජනන යන්ත්‍ර නඩත්තු කටයුතු සඳහා මීට පෙර නවතා තිබූ අතර, විදුලිය නිෂ්පාදනය කරමින් තිබූ පළමු ජනන යන්ත්‍රයද පෙරේදා දින සිදු වූ විදුලි බිඳවැටීමත් සමග මෙලෙස එකවර අක්‍රිය වී ගියේය.

කෙසේ නමුත් මේ වන විට නඩත්තු කටයුතු සඳහා නවතා තිබූ තුන්වන ජනන යන්ත්‍රය නැවත ක්‍රියාත්මක කර ජාතික විදුලි පද්ධතියට විදුලිය ලබා දීමට කටයුතු කරමින් සිටින බවද මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් පැවසීය.

මේ අතර, ජලය උපයෝගී කරගනිමින් සිදුකරන විදුලි නිෂ්පාදනය විශාල ලෙස ඉහළ ගොස් තිබෙන අතර ඊයේ (10දා) වනවිට සමස්ත විදුලි අවශ්‍යතාවෙන් 80.92 %ක් ජලය උපයෝගී කරගෙන විදුලිය නිෂ්පාදනය කර තිබෙන බව විදුලිබල මණ්ඩලය සඳහන් කරයි.

තාප බලාගාරවලින් 11.6%ක් විදුලිය නිෂ්පාදනය කරන අතර, ඉතිරි විදුලි අවශ්‍යතාව සුළං බලයෙන් හා සූර්ය බලයෙන් නිෂ්පාදනය කරගනු ලබයි.

මහා පරිමාණ ජල විදුලි බලාගාරවල ජල මට්ටම් පොදුවේ 98.9%ක් දක්වා ඉහළ ගොස් තිබේ. මේ අනුව මහා පරිමාණ ජල විදුලි බලාගාරවලින් දෛනික විදුලි අවශ්‍යතාවෙන් 69.25%ක් නිෂ්පාදනය කරන අතර, කුඩා ජල විදුලි බලාගාරවලින් 11.67%ක් නිෂ්පාදනය කරගනු ලබයි.

මේ වනවිට සතිඅන්තයේ දෛනික විදුලි අවශ්‍යතාව ගිගාවොට් පැය 30ත් 35ත් අතර ප්‍රමාණයක් වන අතර, සතියේ දිනවල දෛනික විදුලි අවශ්‍යතාව ගිගාවොට් පැය 38ත් 40ත් අතර ප්‍රමාණයක් ගනියි.

# නාගරික සංවර්ධනය මෙතෙක් නොගෙවූ රු.මි.1989ක් ගෙවයි

● නවෝද්‍යා පවනි

කෝවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට ගෙවීමට නොහැකි වී තිබූ රුපියල් මිලියන 1989.75ක මුදල මේ මස 31වන දිනට පෙර ගෙවා අවසන් කරන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පවසයි.

අමාත්‍යාංශය පෙන්වා දෙන්නේ එම මුදල ගෙවීමත් සමග කෝවිඩ් වසංගතය හේතුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය නොගෙවා තිබූ බිල්පත් සියල්ල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් වන බවයි.

මීට අමතරව මේ වසර තුළ කළ සංවර්ධන කටයුතු වෙනුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට ඇති රුපියල් මිලියන 1112.57ක මුදලද මේ වසර අවසන් වීමට පෙර සම්පූර්ණයෙන්ම ගෙවා දැමීමට සැලසුම් කර ඇති බවද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවසීය.

ඉකුත් ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් කර්මාන්තය අර්බුදයට ලක් වූ අතර, විෂය භාර ඇමති ප්‍රසන්න රණතුංග මහතා මේ තත්ත්වය ජනාධිපතිවරයාගේ අවධානයට ලක් කිරීමෙන් පසුව මේ පිළිබඳව අවශ්‍ය පියවර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් කමිටුවක්ද පත් කෙරිණ. ඒ අනුව අදාළ ගෙවීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගත් අතර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය අදාළ හිඟ බිල්පත් ගෙවා අවසන් කරන්නේ ඒ අනුවයි.

මේ අතර ඉදිකිරීම් කර්මාන්තය සඳහා වෙන්වුණු සංවර්ධන බැංකුවක් පිහිටුවීම සඳහා වන යෝජනාවක් මේ වන විට ඉදිරිපත්ව තිබේ. අදාළ යෝජනාව පිළිබඳව සංකල්ප පත්‍රිකාවක් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති අතර, ඊට ලැබෙන ප්‍රතිචාර අනුව නව බැංකුව ස්ථාපනය කෙරෙන බවද ඇමතිවරයා කියයි.

# ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ විශේෂ රැස්වීමක් අද

● නවෝද්‍යා පවනි

ආණ්ඩු පක්ෂ කණ්ඩායමේ විශේෂ රැස්වීමක් අද (11දා) පැවැත්වේ. මෙම රැස්වීම අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.8.30 ට පැවැත්වීමට නියමිතය. පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 1හිදී මෙය පැවැත්වීමට නියමිත බැවින් ඒ සඳහා අනිවාර්යයෙන්ම සහභාගි ලෙස වන සියලුම මන්ත්‍රීවරුන්ට දැනුම් දී තිබේ.




# ධීවර සංස්ථාව නොගෙවා ඇති සේවකයන්ගේ EPF හා ETF මුදල කෝටි 67ක් දක්වා ඉහළට

● ඉන්දික හේවාවිතාරණ

ලංකා ධීවර සංස්ථා සේවකයන්ගේ ගෙවීම පැහැර හැර ඇති අර්ථසාධක හා භාරකාර අරමුදලේ මුදල්වල වටිනාකම මේ වන විට රුපියල් කෝටි 67 ඉක්මවා ගොස් තිබෙන බව ලංකා ධීවර සංස්ථා පොදු සේවක සංගමය සඳහන් කරයි.

2006 වසර සිට 2022 දක්වා අරමුදල් දෙකේ තැන්පත් කළ යුතු මුදල් වරින් වර පැහැර හැර තිබෙන බවත් එහෙත් සමස්ත කාලය තුළදීම සේවක වැටුපෙන් අදාළ අරමුදල් දෙකට මුදල් අයකර ගෙන තිබෙන බවද එම සංගමයේ ලේකම් ජේ. එච්. නිශාන්ත මහතා සඳහන් කළේය.

මේ අනුව අර්ථසාධක අරමුදලේ තැන්පත් කළ යුතු සමස්ත මුදල රුපියල් කෝටි හැට 65 දක්වා ඉහළ ගොස් තිබෙන බවත් භාරකාර අරමුදලේ තැන්පත් කළ යුතු මුදල රුපියල් දෙකෝටි තිස් ලක්ෂයක මුදලක් බවත් පවතින තත්ත්වය තුළ මෙම අරමුදල් දෙකේ ප්‍රතිලාභ අඩුවෙන් ලබාගෙන සේවකයන් සියයක් පමණ විශ්‍රාම ගොස් තිබෙන බවද පවසා සිටියේය.

මීට අදාළ මුදල් නිසි ලෙස තැන්පත් නොකිරීම නිසා ඉදිරි දිනවල විශ්‍රාම යන සේවකයන්ට පවා අඩු මුදලක් ලබාගෙන විශ්‍රාම යාමට සිදුවී තිබෙන බවත් දැනට විශ්‍රාම ගොස් සිටින සියදෙනාගෙන් 72නෙකුට පාරිතෝෂිත දීමනාව ලබා ගැනීමටත් නොහැකි වී තිබෙන බවත් සඳහන් කළේය.

2006 වසරේ සිට 2022 දක්වා කාලය තුළ අදාළ අරමුදල් දෙක තුළ තැන්පත් කළ යුතු මුදල් තැන්පත් කිරීම පැහැර හැර තිබියදී අදාළ ගැටලු විසඳීම අමතක කර මේ වසරට අදාළ මුදල් පමණක් තැන්පත් කරමින් තිබෙන බවත් මේ නිසා සමස්ත මුදලම තැන්පත් කර ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර තිබෙන බවද පවසා සිටියේය.

අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සමගාමීව පවතින ගැටලුව සම්බන්ධයෙන් මේ වන විට දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට පැමිණිලි ඉදිරිපත් කිරීම ආරම්භ කර තිබෙන බවත් සේවකයන් තනි තනි වශයෙන් මෙම පැමිණිලි සිදුකරන බවත් දැනට පැමිණිලි 200ක් සිදුකර තිබෙන බවද සඳහන් කළේය.

# රාගම උකස් මධ්‍යස්ථානයකින් රු. කෝටි 14ක රන් හා මුදල් කොල්ල කෑ

## සැකකරුවන් 05ක් අත්අඩංගුවට

## සැකකරුවන් අතර එම මධ්‍යස්ථානයේ අයකැමිවරියක හා භාරකරුත්



● කැලණිය - ලාල් එස්. කුමාර

රාගම නගරයේ පවත්වාගෙන යන ස්වර්ණාභරණ උකස් මධ්‍යස්ථානයකට පෙරේදා (09දා) දහවල් පැමිණ කෝටි 14ක් පමණ වටිනා රන් හා මුදල් කොල්ල කෑ බව කියන සැකකරුවන් තිදෙනෙකු ඇතුළු 05දෙනෙකු අත්අඩංගුවට ගත් බව රාගම පොලීසිය පවසයි.

සැකකරුවන් රාගම, ගල්වල ප්‍රදේශවල පදිංචිකරුවන් බවත්, සැකකරුවන් අතර කාන්තාවන් දෙදෙනෙකු සිටින අතර, එම මධ්‍යස්ථානයේ භාරකරු හා අයකැමිවරියක්ද සැකකරුවන් අතර වන බවත් පොලීසිය සඳහන් කරයි.

කොල්ලකරුවන් පිරිසක් රාගම නගරයේ පිහිටි රන් භාණ්ඩ උකස් මධ්‍යස්ථානයක තිබූ කෝටි 14ක් පමණ වටිනාකමින් යුත් රන් භාණ්ඩ සමග මුදල් කොල්ල කා පලාගොස් ඇති බවට ලද පැමිණිල්ලක් මත සිදුකළ විමර්ශනයකදී කොල්ල කෑ බව කියන රන් භාණ්ඩ මුදල් සමග සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙම කොල්ලය සැලසුම් සහගත ලෙස සිදුකළ බවට තොරතුරු ලැබී ඇති අතර, මධ්‍යස්ථානයේ තිබූ සී.සී.ටී.වී කැමරා දර්ශන අනුව සිදුකළ විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

සිද්ධිය සම්බන්ධයෙන් රාගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බුද්ධික රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් උපපොලිස් පරීක්ෂකවරුන් වන කසුන් සුභාෂණ, අබේරත්න මහත්වරුන් ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# බත්තලන්ගුණ්ඩුව කලපුවේ සඟවා තිබූ කෝටි 10ක රත්‍රන් සමග ධීවරයන් 2ක් දැලේ

● පුත්තලම - හිරාන් ප්‍රියංකර ජයසිංහ/ කල්පිටිය - කුමාරි කොට්ටහච්චි

බත්තලන්ගුණ්ඩුව කලපුවේ සඟවා තිබූ රුපියල් කෝටි 10කට අධික වටිනාකමකින් යුත් රත්‍රන් කිලෝ හතරක ප්‍රමාණයක් ධීවරයන් දෙදෙනෙකුද සමග පසුගියදා (08දා) අත්අඩංගුවට ගැනීමට නාවික හමුදාව සමත්ව තිබේ.

පුත්තලම කලපුවට අයත් බත්තලන්ගුණ්ඩුව දූපත ආසන්නයේ කලපුවේ තිබී මෙම රත්‍රන් කිලෝ හතර නාවික හමුදාවට ලද බුද්ධි තොරතුරක් මත සොයාගත් බව නාවික හමුදාව පවසයි.



මෙරට සිට ඉන්දියාවට රැගෙන යාමේ අරමුණින් බත්තලන්ගුණ්ඩුව කලපුවේ ආරක්ෂිතව පාර්සලයක දමා සඟවා තිබියදී වයඹ නාවික විධානයට අයත් නාවික නෞකා විජය කඳවුරේ නිලධාරීන් විසින් අදාළ කලපු සීමාවේ සිදුකළ විශේෂ සෝදිසි කිරීමකින් පසුව මෙම රත්‍රන් කිලෝ හතර සොයාගත් බව කියයි.

ඒ සමගම මෙම රත්‍රන් තොගය කලපුවේ සැඟවූ බවට සැකකෙරෙන අවුරුදු 27 හා 35 වයස් සීමාවල පසුවූ කල්පිටිය ප්‍රදේශයේ පදිංචි සැකකරුවන් දෙදෙනා හා ඩිංගි යාත්‍රාවද අත්අඩංගුවට ගැනීමට පොලීසිය සමත්ව ඇත.

මුහුදු මාර්ගයෙන් සිදුකරන මෙවැනි ජාවාරම් මැඩලීමේ අරමුණින් මෙම වැටලීම් සිදුකර ඇති බව නාවික හමුදාව පවසයි. කලපුවේ සඟවා තිබියදී අත්අඩංගුවට ගත් මෙම රත්‍රන් තොගය ඉදිරි විමර්ශන කටයුතු සඳහා කටුනායක රේගු නිවාරණ ඒකකයට භාර දී ඇත.

# පාරිභෝගික ආරක්ෂක පනත සංශෝධනය කිරීමේ සූදානමක්

## මහා පරිමාණ සහල් මෝල් හිමියන් සහල් සඟවා මිල ඉහළ නැවීම පාලනය කිරීමේ පියවරක්

● නිදර්ශනී වික්‍රමසිංහ

මහා පරිමාණ සහල් මෝල් හිමියන් විසින් සහල් සඟවා සිදුකරන මිල ඉහළ නැංවීම වැළැක්වීම සඳහා පාරිභෝගික ආරක්ෂක පනත සංශෝධනය කිරීමට රජය තීරණය කර තිබේ.

ඒ අනුව ඊට අදාළ සංශෝධන වෙළඳ අමාත්‍යවරයා විසින් එළඹෙන මසදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

මේ යටතේ සහල් සඟවාගෙන සිටින මහා පරිමාණ සහල් මෝල් අයිතිකරුවන්ගේ ස්ථාන පරීක්ෂාව සඳහා සහ නඩු පැවරීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට බලතල ලබා දීම රජයේ අරමුණයි.

# තායිලන්තයේ රැකියා දෙනවැයි මුදල් වංචා කළ සැකකරු රිමාන්ඩ්

## පැමිණිලිකරුව සංචාරක වීසා මගින් තායිලන්තයට යවා මුහුදු මගින් මියන්මාරයට ගෙන ගොස් හුදකලා ප්‍රදේශයක රඳවලා

● මහේෂ් මලවර ආරච්චි

තායිලන්තයට යවන බව පවසා මුදල් වංචා කළ මිනිස් ජාවාරමකට සම්බන්ධ ගාල්ල ප්‍රදේශයේ අයෙක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකය මගින් ඊයේ (10දා) අත්අඩංගුවට ගෙන මාතර අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම මස 15වනදා තෙක් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි. මෙසේ රක්ෂිත බන්ධනාගාරගත කෙරුණේ ගාල්ල බටදූව ප්‍රදේශයේ පදිංචි 28 හැවිරිදි පුද්ගලයෙකි.

රුපියල් පන්ලක්ෂ තිස්හයදහසක මුදලකට තායිලන්තයේ රැකියා ලබා දෙන බව පවසා මාතර ප්‍රදේශයේ තරුණයෙක් අදාළ සැකකරු විසින් සංචාරක වීසා මත තායිලන්තය වෙත යවා ඇති අතර, පසුව එම තරුණයා බෝට්ටුවක් හරහා මියන්මාරයට යවා තිබේ. එහිදී සිවිල් වැසියන්ගෙන් තොර ප්‍රදේශයක බලහත්කාරයෙන් රඳවාගෙන සිට තිබෙන අතර කිසිදු මුදලක් හෝ එම කාලය තුළ ඔහුට ලබාදී නොමැත. පසුව එම තරුණයා එතනින් පලාවිත් තානාපති කාර්යාලය දැනුවත් කිරීමෙන් අනතුරුව මෙරටට එවා තිබේ.

පසුව ඔහු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙන අතර ඒ අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකය මගින් ඊයේ (10දා) අදාළ සැකකරුගේ ගාල්ල නිවස වෙත ගොස් පරීක්ෂා කර බැලීමේදී විදෙස්ගත කිරීම සඳහා කිසිදු



බලපත්‍රයක් හෝ ඔහු සන්තකයේ නොතිබී ඇත. මෙසේ බලපත්‍රයක් හෝ නොමැතිව 8දෙනෙක් විදෙස්ගත කිරීමේ චෝදනාවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම සැකකරුට එරෙහිව මේ වනවිටත් විශේෂ විමර්ශනයක්ද සිදුකරමින් පවතී.

ඒ අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් අදාළ සැකකරු අත්අඩංගුවට ගෙන මාතර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ අතර එහිදී මහේස්ත්‍රාත්වරයා නියෝග කරනු ලැබුවේ අදාළ සැකකරු ලබන 15වනදා තෙක් රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙසත් එදිනට මෙම නඩුවට සම්බන්ධ සියලු සාක්ෂිකරුවන් අධිකරණය හමුවට ඉදිරිපත් කරන ලෙසත්ය.

# අලි - මිනිස් ගැටුම් අවම කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කෙරේ

## අලි මිනිස් ගැටුමට විසඳුම වන්නේ ප්‍රජාව මුල් කරගත් විදුලි වැට හා කුඹුරු ආරක්ෂා කරන කාලීන විදුලි වැට ඉදිකිරීමයි

## - අලි මිනිස් ගැටුම් ක්‍රියාකාරී සැලැස්මේ නිර්මාපකයෝ කාරක සභාවට දන්වති

● දිනේෂ් සමරකෝන්

අලි මිනිස් ගැටුම් අවම කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට ඉදිරිපත් කෙරිණි.

ඒ පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම මහතාගේ සභාපතිත්වයෙන් එම කාරක සභාව පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

මෙහිදී අලි - මිනිස් ගැටුම් අවම කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම සඳහා පත්කළ කමිටුවේ සභාපති ආචාර්ය සුමිත් පිලපිටිය මහතා සහ වනජීවී විද්‍යාඥ ආචාර්ය පෘතුවිරාජ් ප්‍රනාන්දු මහතා විසින් මෙම සැලැස්ම කාරක සභාව හමුවේ ඉදිරිපත් කරන ලදී.

2022 වසර තුළ මෙරට වනඅලින් 433දෙනෙකු මියගොස් ඇති බව මෙහිදී අනාවරණය විය. වනජීවී විද්‍යාඥයන් විසින් කාරක සභාව හමුවේ කරුණු දක්වමින් මෙරට භූමියෙන් 62%ක් වූ ප්‍රදේශයක වනඅලි ව්‍යාප්ත වී ඇති බව පෙන්වා දෙන ලදී.

අලි - මිනිස් ගැටුම් අවම කිරීමට විදුලි වැට ඉදිකිරීම පර්යේෂණාත්මකව සිදුකළ යුතු බව එම නිලධාරීහු පෙන්වා දුන්හ. ඒ අනුව අලි - මිනිස් ගැටුම් අවම කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී මූලිකවම ප්‍රජාව මූලික කරගත් ග්‍රාමීය විදුලි වැටත්, කුඹුරු ආරක්ෂා කිරීම උදෙසා කාලීන විදුලි වැටත් ලෙසින් විදුලි වැටවල් ඉදිකිරීම සුදුසු විසඳුම ලෙස අදාළ කමිටුව විසින් හඳුනාගෙන ඇති බව පෙන්වා දෙන ලදී.

ඒ අනුව මෙම අලි වැටවල් ඉදිකිරීමට ප්‍රථමයෙන් අදාළ ප්‍රදේශවල ජනතාවට අලින්ගේ හැසිරීම් හා පුද්ගලයන්ගේ චර්යාවල සිදුවිය යුතු වෙනස්කම් ආදී කරුණු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව කාරක සභාවේ සභාපතිවරයා පෙන්වා දුන්නේය.

ප්‍රජාව දැනුවත් කිරීම සඳහා තමන්ට කළ හැකි වැඩසටහන් පිළිබඳව කාරක සභාවට දැනුම් දෙන ලෙස එදින කාරක සභාව අවස්ථාවට පැමිණ සිටි වනජීවී හා පරිසර සංවිධානවලින් කාරක සභා සභාපතිවරයා ඉල්ලා සිටින ලදී. දැනුවත් කිරීමට අලි - මිනිස් ගැටුම් පවතින ප්‍රදේශ නිවැරදිව හඳුනාගෙන තොරතුරු ලබා දෙන්නේ නම් ඒ සඳහා තම දායකත්වය ලබාදිය හැකි බව වනජීවී හා පරිසර සංවිධාන නියෝජිතයන් මෙහිදී පවසන ලදී.

අලි - මිනිස් ගැටුම් අවම කිරීමට නම් ඉඩම් පරිහරණ කිරීමේ ජාතික සැලැස්මක් අවශ්‍ය බව කමිටුව හමුවේ අදහස් දක්වමින් විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා පැවසුවේය. මෙහිදී ග්‍රාමීය මට්ටමින් වනඅලින් සැරිසරන ප්‍රදේශය නිවැරදිව හඳුනා ගැනීමේ වැදගත්කමද, අලි - මිනිස් ගැටුම දැඩිව පවතින ප්‍රදේශීය ලේකම් කොට්ඨාස හඳුනා ගැනීමේ වැදගත්කමද, අලි සංගණනයක් කිරීමේ පරමාර්ථය වැඩිපුර සිටින අලි ඇතුන් අපනයන කිරීම නොවන බවද විපක්ෂනායකවරයා පෙන්වා දුන්නේය.


# Dialog Television වෙතින් අලුත්ම 65" ස්මාර්ට් TV එකක් දිනාගන්න!

ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයින් වෙත නිරතුරුවම අසමසම ටෙලිවිෂන් අත්දැකීම් සමගින් ඉහළම රසාස්වාදය තිළිණ කරන Dialog Television" මේ උත්සව සමයේ සුවිශේෂී Dialog Television Seasonal Channel pack සමග නත්තලේ සතුට ප්‍රේක්ෂක ආලින්දය කරා රැගෙන එයි. මෙම channel pack එක activate කරන ඔබට සියලුම Dialog Television චැනල් දින 30 ක් පුරාවට හිතේ හැටියට නරඹන ගමන්ම අඟල් 65 අලුත්ම ස්මාර්ට් TV එකක් දිනා ගැනීමේ අවස්ථාව හිමිවේ.

එමෙන්ම දේශීය වශයෙන්, සිංහල, දෙමළ, ඉංග්‍රීසි, හින්දි ආදී භාෂාවලින් ප්‍රවෘත්ති, විනෝදාස්වාද, කාලීන, ආගමික, ළමා, කාටූන්, ක්‍රීඩා මෙන්ම, සංගීත, චිත්‍රපට හා ටෙලිනාට්‍ය ආදී වශයෙන් පෙළ ගැසෙන සියලු චැනල් නැරඹීමේ හැකියාව පවතී. ශ්‍රී ලාංකීය ප්‍රේක්ෂකයින් ජාත්‍යන්තර ටෙලිවිෂන් අත්දැකීම වෙත ගෙනයමින්, ලොව පුරා ජනප්‍රිය ටෙලිවිෂන් චැනල් ගණනාවක්ම Seasonal Channel Pack හරහා පිරිනමයි. ඒ අනුව, ඔබ Cricket Star Sports, Sony Sports, Nickelodeon, Cartoon Network, Da Vinci, France 24, Euro News, ) flix, Star Gold Romance, HITS MOVIES, Zee Cinema සහ Star Plus ආදී සියලුම Dialog Television චැනල්ස් 125 ම මාසයක් පුරාම මෙම දීමනාවෙන් නැරඹිය හැකිය.

ඒ අතරින්, ක්‍රීඩා ලෝලී පාරිභෝගිකයින්ට ක්‍රීඩා ආස්වාදය රැගෙන එන, සුවිශේෂී Sony Sports Ten 1, Eurosport, Sony Sports Ten 2, Star Sports 1, Star Sports 2 ඇතුළු ක්‍රීඩා චැනල් සියල්ලද දීමනාව සමගින් මාසයක් පුරාම නැරඹිය හැක.




උත්සව සමයේ පාරිභෝගිකයින්ට නවතම ස්මාර්ට් TV එකක් දිනා ගැනීමට අවස්ථාව සමගින් රු. 499 වැනි සුළු මුදල මෙම seasonal channel pack එක ඔබට SMS හෝ My Dialog App මඟින් activate කරගත හැකිය. SMS මඟින් activate කිරීමට ON හිස්තැනක් dialog television සම්බන්ධතා අංකය හිස් තැනක් 5555 type කර 0770 679 679 ට SMS කළ යුතු වේ. මෙම දීමනාව 2023 දෙසැම්බර් 31 වැනිදා දක්වා වලංගු වේ.

මේ උත්සව සමයේ මුළු පවුලත් එක්කම TV බලන ඔබත් seasonal channel pack එක activate කරගෙන අලුත්ම 65" ස්මාර්ට් TV එකක් දිනාගන්න අවස්ථාවක් උදාකරගන්න !

# කැලණිය සරසවියේ පීඨ 3ක් අද සිට විවෘතයි

● කැලණිය ලාල් එස් කුමාර

සිසුන් හා ආරක්ෂක නිලධාරීන් අතර ඇතිවූ ගැටලුකාරී තත්ත්වයක් මත ඉකුත් දින වසා දැමූ කැලණි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු අද (11දා) අදියර කිහිපයක් යටතේ නැවත ආරම්භ කිරීමට කටයුතු යොදා ඇතැයි එම විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය නිලන්තිද සිල්වා මහත්මිය පැවසුවාය.

ඒ අනුව විද්‍යාපීඨය, තාක්ෂණ පීඨය සහ කළමනාකාරණ පීඨය මුල් අදියර යටතේ අද දින ආරම්භ කෙරේ.

විශ්වවිද්‍යාලය ඉක්මනින් නැවත ආරම්භ කිරීම සඳහාත්, සිසුන් හා ආරක්ෂක අංශයේ නිලධාරීන් අතර ඇතිවූ ගැටුම් සහ අනවබෝධයන්ට පාදක වූ සිදුවීම් පිළිබඳ විධිමත් විමර්ශනයක් සිදුකිරීම සඳහාත් විශේෂ කමිටු තුනක් පත්කර ඇතැයිද ඇය පැවසුවාය.

ආරක්ෂක නිලධාරියකු විසින් පඤ්ඤදරාම නේවාසිකාගාරයේ විශේෂ අවශ්‍යතා සහිත සිසුවාගේ මවට සිදුකළා යැයි කියන අයුතු බලපෑමක් සම්බන්ධව සොයා බැලීමට එක් කමිටුවක්ද, ආරක්ෂක අංශයේ නිලධාරියෙකු රාත්‍රී කාලයේදී තම විවේක කාමරයේ නිදා සිටියදී ශිෂ්‍ය ක්‍රියාකාරීන් පිරිසක් විසින් පැහැරගෙන ගොස් පහරදී ගැට ගැසීමට අදාළ සිදුවීම සොයා බැලීමට තවත් කමිටුවක්ද පත්කර ඇත.

මෙම කමිටු මගින් අදාළ සිදුවීම්වලට සෘජුවම දායක වූ පුද්ගලයන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන තිබෙන අතර තවදුරටත් මෙම කමිටුව විසින් ප්‍රකාශ සටහන් කර ගැනීමට නියමිත බවද ඇය පැවසුවාය.

ඒ අනුව විශ්වවිද්‍යාලයේ පාලනාධිකාරිය විසින් සිදුකළ මූලික විමර්ශන කටයුතුවලදී මෙම සිද්ධියට අදාළ සිසුන් සිවුදෙනකු හඳුනාගත් අතර මූලික පියවරක් වශයෙන් එම සිසුන් සිවුදෙනා පන්ති තහනමට ලක් කර ඇතැයි උපකුලපතිතුමිය පැවසුවාය.

එසේම ආරක්ෂක නිලධාරීන් හා සිසුන් අතර ඇති වූ ගැටුම අදාළ සිද්ධිය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශ්වයකට තමන් සතුව ඇති සාක්ෂි, ලේඛන හෝ කුමන හෝ තොරතුරු පවතී නම් දෙසැම්බර් 12වැනිදා පෙරවරු 9.00 සිට 11.00 දක්වා කාලය තුළදී මෙම කමිටු හමුවේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඇතැයිද ඇය පැවසුවාය. මෙම සිදුවීම් සම්බන්ධව පරීක්ෂණ කටයුතු තවමත් සිදුකරමින් පවතින අතර, අවසන් වාර්තාව තමා වෙත ලැබී නොමැති බවත් මේ සම්බන්ධව කරුණු යටපත් කිරීමට විශ්වවිද්‍යාලයට කිසිම අවශ්‍යතාවක් නොමැති බවත් මෙම විමර්ශන කටයුතු අපක්ෂපාතීව හා විනිවිදභාවයෙන් යුතුව සිදුකරන බවත් උපකුලපතිතුමිය වැඩිදුරටත් පැවසුවාය.

# ජනප්‍රිය නොවන තීරණ ගැනීමට සිදුව තිබෙනවා

## - මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය


● දිනේෂ් සමරකෝන්

ජනප්‍රියභාවයට එයා ගිය වගකීමක් ආණ්ඩුවට තිබෙන බව දන්නා බවත්, ඒ අනුව ජනප්‍රිය නොවන තීරණ ගැනීමට සිදුව ඇති බවත් මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේ ඊයේ (10දා) පැවති එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමේ විවාදය ආරම්භ කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මහතා මෙලෙස සිය අදහස් දක්වා සිටියේය.

"මෙතනදී වැදගත්ම දේ තමයි භාණ්ඩ අයිතම 97ක වැට් බදුවල නිදහස ඉවත් කිරීම. අපිට මුදල් අමාත්‍යාංශය ලෙස තවම ජනප්‍රිය දේවල් කියන්න තියෙන අවස්ථාව අඩුයි. අපිට ජනප්‍රිය දේවල් කියන්න තව ටික කාලයක් අවශ්‍ය වෙයි. අපිට මේ රටේ ආදායම වැඩි කරගන්න වෙලා තියෙනවා. මෙහෙම කරන එවා ජනප්‍රිය වෙන්නේ නෑ. අපි දන්නවා ඒක. නමුත් අපිට මේ රටේ පැවැත්ම සඳහා මේ රටේ රාජ්‍ය ආදායම වැඩිකර ගැනීමේ අවශ්‍යතාවක් තියෙනවා. මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන් මේ ස්ථාවරය ගන්න ඕනි. අපි මේ රටේ ප්‍රශ්න දන්නේ නැතිව නෙවෙයි. මෙවැනි ආර්ථික ආගාධයකින් ගොඩ එන රටක සාමාන්‍ය ප්‍රශ්න තියෙන ජනතාව සියල්ලම අපි එතුමන්ලා වගේම පැහැදිලිව දන්නවා.



අපි ජනතාවට ලබා දිය යුත්තේ ස්ථාවර රටක්. ජනප්‍රියභාවයට වඩා එහා ගිය වගකීමක් අපිට තියෙනවා කියලා අපි දන්නවා. දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ආදායම 8.3%යි. අපේ වියදම 18.5%යි. අපිට ඇති වුණු තත්ත්වය දන්නවා. අපේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව 128%ක් වුණා. අපි මහා ප්‍රශ්නයකට මැදි වුණා."

# පාසල්වලට සූර්ය පැනල සවිකිරීම මිනුවන්ගොඩින් අරඹයි

● නවෝද්‍යා පවනි

පාසල් සඳහා සූර්ය පැනල සවි කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට නියමිතය. එම නියාමන ව්‍යාපෘතිය මිනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයෙන් ආරම්භ කර ඇත. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

ප්‍රසන්න රණතුංග ඇමතිවරයා පවසන්නේ මිනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ මසකට රුපියල් 20,000කට වැඩි විදුලි බිලක් ඇති පාසල් සඳහා මුලින්ම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවයි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා මේ බව සඳහන් කළේ මිනුවන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේදී පැවැති මිනුවන්ගොඩ අධ්‍යාපන ව්‍යුහ කමිටු රැස්වීමට සහභාගී වෙමිනි.

මිනුවන්ගොඩ කලාපයේ ඉහළ ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලබා ගත් පාසල් 08ක් අගයමින් එම පාසල්වල විදුහල්පතිවරුන්ට සහතිකපත් ප්‍රදානය කිරීම මෙහිදී සිදුකෙරුණි.

අනතුරුව මිනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 35ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිර්මාණය කළ ප්‍රධාන සැලසුම් නාගරික සංවර්ධන අධිකාරියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මහින්ද විතානාරච්චි මහතා විදුහල්පතිවරුන්ට මෙහිදී පිළිගැන්වීය.

එමෙන්ම 'අපේ පාසල - අපේ දෑතින් සුරකිමු' ව්‍යාපෘතිය යටතේ පාසල් 17ක වර්ණාලේප හා සුළු අලුත්වැඩියාව සඳහා මුදල් ලබාදීමද මෙහිදී සිදු කෙරුණි. ඇමති ප්‍රසන්න රණතුංග මහතාගේ ඉල්ලීම මත මිනුවන්ගොඩ පාසල් සංවර්ධනය කිරීම සඳහා හිටපු බස්නාහිර පළාත් සභා මන්ත්‍රී නවුෆර් ෆවුසි මහතාට අයත් සහීඩා පදනම ඉදිරිපත් වී තිබේ. එම පදනම ලබාදුන් රුපියල් ලක්ෂ 100ක මුදලක් පාසල් 08ක සංවර්ධන කටයුතු වෙනුවෙන් විදුහල්පතිවරුන්ට මෙහිදී ප්‍රදානය කළහ.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට සහ විදුහල්පතිවරුන්ට අවධාරණය කළේ මිනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ පවතින ගුරු පුරප්පාඩුව ලබන වසරේ මුල් කාර්තුවේදී අවසන් කිරීමට කටයුතු කරන බවයි.

# මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට සූදානම් වූ දෙදෙනෙක් T56ක්, උණ්ඩ හා මත් කුඩු සමග දැලේ

● බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ

සිය වැඩිමහල් සහෝදරයා සහ ඥාති සහෝදරයන් තිදෙනෙකු ඝාතනය කළ පුද්ගලයන් ඝාතනය කිරීමට සූදානමින් සිටි පුද්ගලයකු සහ ඔහුගේ සහායකයා අත්අඩංගුවට ගත් බව කොළඹ අපරාධ කොට්ඨාසය සඳහන් කරයි.

සැකකරුවන් සමග ටී 56 ස්වයංක්‍රීය ගිනි අවියක්, මැගසිනයක්, ජීව උණ්ඩ තිහක් හා හෙරොයින් ග්‍රෑම්12 මිලිග්‍රෑම් 910ක්ද පොලිස් භාරයට ගෙන ඇත.

පොලිස් භාරයට ගත් ගිනිඅවියේ රහස් අංකය මකා දමා ඇතැයි පොලිස් නිලධාරියෙක් පැවසීය.

කොළඹ අපරාධ කොට්ඨාසයේ බස්නාහිර පළාත් දූෂණ මර්දන අංශ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබිණි.

ඒ අනුව සැකකරුගේ නිවස ඉදිරිපිට වළදමා තිබූ ගිනි අවිය, මැගසිනය සහ ජීව උණ්ඩ තොගය පොලිස් භාරයට ගෙන ඇත.

2018 දෙසැම්බර් 25 වැනිදා තංගල්ල කුඩා වැල්ල ධීවර වරායේදී 2018 දෙසැම්බර් 25 වැනිදා ඝාතනයට ලක්වූ පුද්ගලයන් 05දෙනාගෙන් තිදෙනෙකුම අත්අඩංගුවට පත් ප්‍රධාන සැකකරුගේ ඥාතීන් බවත් 2021 වසරේදී ප්‍රබල මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවෙකු හා මිනිස් ජාවාරම්කරුවෙකු වන කුඩාවැල්ල ප්‍රදේශයේ අසේල සම්පත් රත්නවීර යන ප්‍රධාන සැකකරුගේ වැඩිමහල් සහෝදරයා ද වෙඩි තබා ඝාතනය කර තිබිණි.

එම ඝාතන සිදුකළ පාර්ශ්ව වලින් පලිගැනීමට ප්‍රධාන සැකකරු විසින් මෙලෙස ගිනිඅවිය සන්තකයේ තබාගෙන ඇතැයි පොලීසිය සඳහන් කරයි.



සැකකරුවන් දෙදෙනා තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර රැඳවුම් නියෝග මත කොළඹ අපරාධ කොට්ඨාසයේ රඳවාගෙන වැඩිදුරටත් ප්‍රශ්න කිරීමට නියමිතය.

බස්නාහිර පළාත් දූෂණ මර්දන අංශය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# නාන කාමරයේ වැටී අසාධ්‍යව ත්‍රිරෝද රථයකින් රෝහලට යමින් සිටි සයමස් ගැබිනිය බිහිකළ බිළිඳු මරුට

● මත්තේගොඩ ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න

නාන කාමරයේ වැටී අසාධ්‍ය තත්ත්වයෙන් පසු වූ සයමස් ගැබිණි මවක ප්‍රතිකාර සඳහා හෝමාගම මූලික රෝහලට රැගෙන යමින් සිටි ත්‍රිරෝද රථය තුළදී උපන් බිළිඳ රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇතැයි නවගමුව පොලීසිය පවසයි.

වලස්මුල්ල, කටුවන ප්‍රදේශයේ සිට පැමිණ නවගමුව යශෝධරා මාවතේ කුලී නිවසක පදිංචිව සිටි අඹුසැමි යුවළකට දාව බිළිඳෙකු මෙසේ මියගොස් ඇතැයි පොලීසිය සඳහන් කරයි.

මෙම අඹුසැමි යුවළ මීට මාස හයකට පමණ පෙර මෙම කුලී නිවසේ පදිංචිව සිට ඇති අතර අලුයම කාලයේදී නාන කාමරයට ගොස් යළි පිටතට එමින් සිටියදී එක්වරම පය ලිස්සා මෙසේ වැටී අනතුරකට ලක්ව තිබිණි. ඉන් අසාධ්‍ය තත්ත්වයට පත් වූ ගබිනි මව ප්‍රතිකාර සඳහා ත්‍රිරෝද රථයකින් හෝමාගම මූලික රෝහලට රැගෙන යමින් සිටියදී මෙම දරු ප්‍රසූතිය සිදුව තිබේ. ඉන් මද වේලාවකට පසුව උපන් බිළිදා ද සමග කාන්තාව හෝමාගම මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව එහි මූලික ප්‍රතිකාර ඒකකයේදී පරීක්ෂා කළ වෛද්‍යවරුන් පවසා ඇත්තේ බිළිදා මියගොස් ඇති බවයි.

ඒ අනුව මියගිය බිළිදාගේ මෘතදේහය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය හෝමාගම මූලික රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරිවරිය ලවා සිදු කරන ලෙසට හෝමාගම හදිසි මරණ පරීක්ෂක සාම මිනිසුරු චින්තක උදය කුමාර මහතා පොලීසියට නියෝග කළේය.

# අයිස් හා හෙරොයින් ජාවාරමේ නිරත දෙදෙනෙකු දැලේ

● දෙහිවල එච්.එම්.ධර්මපාල

අයිස් හා හෙරොයින් ජාවාරම්හි නිරත දෙදෙනෙකු දෙහිවලදී හා රත්මලාන දුම්රියපොළ පාරේදී අත්අඩංගුවට ගත් බව ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය සඳහන් කරයි.

අයිස් මත්ද්‍රව්‍ය ජාවාරමේ නියුතු පුද්ගලයකු අලෙවියට සන්තකයේ තබා ගෙන සිටි අයිස් මිලිග්‍රෑම් 10100ක් සමග දෙහිවල ඕඩියන් හන්දියේදී ගල්කිස්ස කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශය මගින් අත්අඩංගුවට ගෙන ඇතැයි පොලීසිය පැවසීය.

ඕබන් පෙදෙස පදිංචි 28 හැවිරිදි පුද්ගලයෙක් මෙසේ අත්අඩංගුවට පත්ව ඇත.

මේ අතර හෙරොයින් ජාවාරමේ නියුතු පුද්ගලයකු අලෙවියට තබාගෙන සිටි හෙරොයින් මිලිග්‍රෑම් 6000ක් සමග රත්මලාන දුම්රියපල පාරදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය මගින් අත්අඩංගුවට ගෙන ඇතැයි ගල්කිස්ස පොලීසිය පැවසීය.

රත්මලාන, වීරසේන සිල්වා මාවත පදිංචි 29 හැවිරිදි පුද්ගලයෙක් මෙසේ අත්අඩංගුවට පත්ව ඇත.

ගල්කිස්ස කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශය සිද්ධි පිළිබඳ වැඩිදුර පරීක්ෂණ මෙහෙයවයි.

# විදුලිය විසන්ධි වීම ගැන ලංවිම වන්දි ගෙවිය යුතුයි

## - පා.ම.පාඨලී චම්පික රණවක

● එස්. කරුණාරත්න

රට පුරා විදුලිය විසන්ධි වීම සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් වගකීම භාරගෙන ඒ සඳහා වන්දි ගෙවිය යුතු බව හිටපු විදුලිබල අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතා ඊයේ (10දා) පැවසීය.

ඒ මහතා මේ බව පවසා සිටියේ, එක්සත් ජනරජ පෙරමුණ පක්ෂයේ දඹුල්ල බලමණ්ඩල රැස්වීමේ ජනතාව දැනුවත් කිරීමේ අවස්ථාවකට එක්වෙමිනි.

එහිදී වැඩිදුරටත් මාධ්‍ය අමතමින් ඒ මහතා පවසා සිටියේ, විදුලි බලමණ්ඩලය පාඩුවීමක් නැති බවත්, මේ වනවිට ලාභ ලබන ආයතනයක් වන අතර, කිසිදු ආකාරයකින් විදුලිය රට පුරා විසන්ධි වීමට ඉඩක් නොමැති බවත්ය.

පසුගිය කාලයේ විදුලිය මිල ඉහළ දැමීම සිදු නොකළ යුතු බව දැනුම්දී තිබුණද, වැඩි කිරීම නිසා මේ වනවිට අර්බුද හටගෙන තිබෙන බවද හෙතෙම පෙන්වා දුන් අතර, මේ වනවිට රට පුරා විදුලි පාරිභෝගිකයන් ලක්ෂ පහමාරකගේ පමණක් විදුලිය විසන්ධි කර තිබෙන්නේ, විදුලි බිල ගෙවා ගැනීමට නොහැකි වීම නිසා බවද හෙතෙම පෙන්වා දුන්නේය.

දෙසැම්බර් මාසයේ රුපියල් මිලියන 25ක පමණ ලාභයක් විදුලිබල මණ්ඩලයට ලැබෙන බවත්, සමස්ත ලාභය මිලියන 50 ඉක්මවා යන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

මහජන උපයෝගිතා කොමිසම පත් කොට ඇත්තේ, මහජනතාවගේ වේදනාව පීඩනය පිළිබඳ පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමට වන නමුත්, එය රබර් සීල් එකක් බවට පත්ව තිබෙන බවද හෙතෙම අවධාරණය කළේය.

මෙම තත්ත්වය අනුව මහජන උපයෝගිතා කොමිසමද ඉල්ලා අස්විය යුතු බවද පෙන්වා දෙන ඒ මහතා සඳහන් කරනුයේ, ඔවුන් නඩත්තු කිරීමද ප්‍රශ්නයක් බවයි. විධිමත් පරීක්ෂණ පවත්වනවා කියන ප්‍රකාශ පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි බවත්, මීට පෙරද එවැනිම පරීක්ෂණ වාර්තා සිදුකොට ඔවුන්ගේ වගකීම ඉටුකර නැතැයිද හෙතෙම පෙන්වා දුන්නේය.

# ජනතාවට ජීවත්වීමට අවශ්‍ය වැට් බදු නිදහස ආණ්ඩුව අහිමි කර තිබෙනවා

## - සජබ පා.ම.ආචාර්ය හර්ෂ ද සිල්වා

● දිනේෂ් සමරකෝන්

ජනතාවට ජීවත්වීමට අවශ්‍ය වැට් බදු නිදහස වර්තමාන ආණ්ඩුව විසින් අහිමි කර තිබෙන බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේ ඊයේ (10දා) පැවති එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමේ විවාදය ආරම්භයේදී අදහස් පළ කරමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා මෙලෙස අදහස් දක්වා සිටියේය.

"දැන් මුලින්ම කියන්න ඕන මෙතනදී භාණ්ඩ 97ක් නිදහස් කර ගැනීම ඉවත් කර ගන්නවා කියලා මේ කියන්නේ. ඒ කියන්නේ නිදහස් කරලා තියෙනවා ඒවා ඉවත් කර ගන්නවා, ඒ අනුව නිදහස් නෑ. ඒ කියන්නේ වැට් එක වදිනවා. මේක වහෙන් ඔරෝ භාෂාවෙන් කිව්වේ. ඇමතිතුමා කිව්වේ නෑ 97ට වැට් එක ගහනවා කියලා. ඇමතිතුමා කිව්වේ 97ක් නිදහස් කරපුවා ඒ නිදහස් කිරීමෙන් ඉවත් කර ගන්නවා කියලා. කෙලින්ම කියන්න පුළුවන්නේ අපි 97ට වැට් එක ගහනවා කියලා. එහෙම කියන්නකෝ.

ඇමතිතුමා කිව්වා දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව අපිට 15%කවත් ආදායමක් නැතිනම් අපිට මේ වැඩ කරගෙන යන්න අමාරුයි කියලා. අපි 100%ක් පිළිගන්නවා. ඔබතුමා හොඳටම දන්නවා දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව 20%ක ආදායමක් තිබුණේ ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ කාලයේ. ඉන්පසු ඔබතුමන්ලා 1994දී ඇවිත් ජනප්‍රිය තීන්දු ගත්තා. ඒ 1994 ඉඳලා ගත්ත ජනප්‍රිය තීන්දු නිසා මේ ආදායම අඩු වෙලා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා අවසානයේදී ගත්ත තීරණය හරහා බදු නැත්තටම නැති වෙලා, 08%ට ආදායම පහළට වැටුණා. එහෙම වෙලා තමයි රට බංකොළොත් වුණේ. මේක ජනතාව විසින් තමන් මත පටවා ගත්ත දෙයක් නෙවෙයි. ඔබතුමන්ලා විසින් විනාශ කළ ආර්ථිකයක්. එතනදී ජනතාවට ජීවත් වෙන්න ඕන දෙවල් තෝරගෙන වැට් නිදහසක් දීලා තිබුණා. දැන් ඒ නිදහස අහිමි කරලා තියෙනවා."

# ගම්පහ උකස් මධ්‍යස්ථානයකින් රු.ලක්ෂ 165ක මුදල් හා රන් භාණ්ඩ සොරා ගෙන

● ගම්පහ තිලකරත්න දිසානායක

ගම්පහ, උඩුගම්පොල - නයිවල පාරේ පිහිටි උකස් මධ්‍යස්ථානයකට ඇතුළු වූ පුද්ගලයන් දෙදෙනෙකු විසින් එහි සේවිකාවන් තිදෙනෙකුට තියුණු ආයුධයක් පෙන්වා සේප්පුවෙහි තිබූ මුදල් සහ රන් අභරණ පැහැර ගෙන ගොස් ඇතැයි ගම්පහ මූලස්ථාන පොලීසිය සඳහන් කරයි.

සේප්පුවෙහි තිබූ මුදල් රුපියල් ලක්ෂ 15ක් පමණ සහ රුපියල් ලක්ෂ 150ක් පමණ වන රන් අභරණ තොගයක් කොල්ලකරුවන් විසින් පැහැරගෙන ගොස් ඇති බවට පැමිණිලි කොට ඇතැයි පොලීසිය පවසයි.

උකස් මධ්‍යස්ථානයේ සේවිකාවක් උදෑසන උකස් මධ්‍යස්ථානය විවෘත කරනවාත් සමගම කොල්ලකරුවන් ඊට ඇතුළු වී අනෙක් සේවිකාවන් දෙදෙනාද පැමිණි පසු ඔවුන් සතුව තිබූ සේප්පුවෙහි යතුරු ලබා ගනිමින් කොල්ලකෑම සිදු කළ බවට එම සේවිකාවන් කළ පැමිණිල්ලෙහි සඳහන් බවද පොලීසිය කියයි.

ගම්පහ මූලස්ථාන පොලීසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# පූගොඩ පොලීසියෙන් ටී 56 ගිනිඅවියක් සොරාගත් දෙදෙනා රිමාන්ඩ්

● කිරිඳිවැල - උපාලි රණවීර

පූගොඩ පොලීසියට අයත් ටී 56 වර්ගයේ රාජකාරි ගිනි අවියක් සොරකම් කර ගෙන යෑමේ සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයන් දෙදෙනා මෙම මස 21 වැනිදා දක්වා රක්ෂිත භාරයට පත් කරන ලෙස පූගොඩ මහේස්ත්‍රාත් ඩබ්ලිව්.ඒකනායක මහතා පෙරේදා (09දා) නියෝග කළේය.

පූගොඩ, වලව්වත්ත හා අමුහේන පැපිලිවල පදිංචිකරුවෝ දෙදෙනෙක් මෙසේ රිමාන්ඩ් භාරයට පත් කෙරිණි.

මොවුන් විසින් ඉකුත් දින තම හිතවතෙකු ඇප මත මුදා ගැනීමට පැමිණි අවස්ථාවේදී ත්‍රිරෝද රථයෙහි තිබී මෙම ගිනිඅවිය සොරකම් කරගෙන ගොස් ඇති බව පොලීසිය කියයි.

එම දින පොලීසියට පැමිණි සියලුම පිරිස් පිළිබඳ පරීක්ෂණ සිදු කළ පොලීසිය අදාළ පුද්ගලයන් දෙදෙනාගේ නිවෙස් පරීක්ෂා කිරීමේදී එම ගිනිඅවිය සැකකරුවෙකුගේ නිවස තුළ තිබියදී අත්අඩංගුවට ගෙන තිබේ.

පූගොඩ පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් වැඩසටහන් රැසක්

● සාකල්‍යා සඳමාලි

ජාත්‍යන්තර ආබාධිත දිනය නිමිත්තෙන් සංවිධානය කර තිබූ දිරිය ප්‍රතිභා සබරගමුව පළාත් සැමරුම් උත්සවය පසුගියදා ආණ්ඩුකාර අධිනීතිඥ නවීන් දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර පිහිටි පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි.

මෙදින පළාත් විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව ඉලක්ක කර ගනිමින් අභිප්‍රේරණ



වැඩසටහන්, චිත්‍ර තරඟ, ස්වයං රැකියා උපකරණ බෙදා දීම, බේල් ක්‍රමයෙන් සකස් කළ ග්‍රන්ථ එළිදැක්වීම ඇතුළු විශේෂාංග රැසක් මීට එක් කර තිබිණි.

# විදෙස්ගත ශ්‍රමිකයන් නොවැම්බරයේදී ඇ.ඩො.මි. 573ක් මෙරටට එවලා

● නවෝද්‍යා පවනි

විදෙස්ගත ශ්‍රමිකයන් නොවැම්බර් මාසයේදී ඇමරිකානු ඩොලර් මිලියන 573ක් මෙරටට එවා ඇති බව ශ්‍රී ලංකා විදෙස් සේවා නියුක්ති කාර්යාංශය පවසයි. මේ වසරේදී පමණක් ඩොලර් බිලියන 5.4ක මුදලක් රට තුළට රැගෙනවිත් ඇති බවද කාර්යාංශය සඳහන් කරයි.

